# THE FACULTY JOURNAL OF HUMANITIES AND SOCIAL SCIENCES

FJHSS

**Volume 08**

**Issue 02**

**December 2019**

Faculty of Humanities and Social Sciences

University of Ruhuna

Matara

Sri Lanka

**The Faculty Journal of Humanities and Social Sciences**

**Volume 08, Issue 02. December 2019**

Copyright © December 2019, Faculty of Humanities and Social Sciences, University of Ruhuna, Matara, Sri Lanka.

All rights reserved. No part of this publication may be reproduced, stored in a retrieval system or transmitted by any means, electronic, mechanical photocopying, and recording or otherwise, without written consent of the publisher.

ISSN 1800-3486

Editors

Senior Prof. Gamini Fonseka

Dr. P. H. Amaraweera

Mr. P. H. Wimalasiri

Rev. O. U. Dammadheera Theri

Mrs. H. M. T. M. H. Molagoda

Printed by

Neat Graphics (Pvt) Ltd,
Rahula Road, Matara. Sri Lanka +94 41-2223174

Published by

Faculty of Humanities and Social Sciences

University of Ruhuna

Matara, Sri Lanka.

Tel: +94 41 22 270 10

Email: fjhss@hss.ruh.ac.lk

# The Faculty Journal of Humanities and Social Sciences

**Volume 08, Issue 02. December 2019**

The Faculty Journal of Humanities and Social Sciences, Volume 08, Issue 02. December 2019 is a peer-reviewed journal published biannually by the Faculty of Humanities and Social Sciences, University of Ruhuna. As a multidisciplinary journal, it intends to provide a common platform for academics, researchers and professionals to publish their research results in areas pertaining to Humanities and Social Sciences.

**Editorial Office**

The Faculty Journal of Humanities and Social Sciences

Faculty of Humanities and Social Sciences

University of Ruhuna

Matara

Sri Lanka

Tel: +94 41 22 27010

Email: fjhss@hss.ruh.ac.lk

**The Faculty Journal of Humanities and Social Sciences**

**Volume 08, Issue 02. December 2019**

**Editors**

Senior Prof. Gamini Fonseka

Department of English and Linguistics, University of Ruhuna, Matara.

Dr. P. H. Amaraweera

Department of Geography, University of Ruhuna, Matara.

Mr. P. H. Wimalasiri

Department of Sinhala, University of Ruhuna, Matara.

Rev. O. U. Dammadhera Theri

Department of Pali and Buddhist Studies, University of Ruhuna, Matara.

Mrs. H. M. T. M. H. Molagoda

Department of English Language Teaching, University of Ruhuna, Matara.

## Contents


**Impact of the Teachers' Self-Motivation on the Quality of the TESL Teacher Training Programmes in Sri Lanka** 1
K.S.G.S. Nishantha

**The Last Trumpet from *Sinharaja*: A Status Study of Elephant Population in Sinharaja World Heritage Site** 21
Manjula Karunaratne

**"Big Brother" and Foucault: Power of Surveillance in George Orwell's *1984*** 53
P.W.B.J. Chathurya

**A Model for Seeking the Determinants of Sri Lanka Telecom (SLT) Monthly Household Expenditure** 63
S.S. Langappuli

**පුස්තකාලයාධිපතිත්වය, වෘත්තීය කාර්යය හා අභියෝග පිළිබඳ විමර්ශනාත්මක ප්‍රවේශයක්** 77
යු. ඒ. ලාල් පන්තිල

**පුරාතන ලංකාවේ රාජ්‍ය පාලනය තුළින් නිරූපිත යහපාලන ලක්ෂණ** 89
කංචන ජනප්‍රිය

**දේශීය පාලන සමයේ ඉඩම් අයිතිය හා භුක්තිය සම්බන්ධයෙන් රජුගේ කාර්යභාරය** 109
ජේ. කේ. ඒ. කාන්ති

# පුස්තකාලයාධිපතිත්වය, වෘත්තීය කාර්යය හා අභියෝග පිළිබඳ විමර්ශනාත්මක ප්‍රවේශයක්

යූ. ඒ. ලාල් පත්තිල

පුස්තකාලය
රුහුණ විශ්වවිද්‍යාලය
මාතර
ualal@lib.ruh.ac.lk

**සංක්ෂේපය**

මානව සමාජයේ සංවර්ධන ඉලක්ක ඇතුළු නොයෙක් අවශ්‍යතා සපුරා ගැනීම සඳහා විවිධ හැකියාවන් සහිත මානව සම්පත් අවශ්‍ය ය. එසේ ම ඈත අතීතයේ සිට ම මිනිසා සිය දෛනික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා යම් යම් ක්‍රියාකාරකම්වල නිරත වූ බව දැකිය හැකි ය. ඒ අනුව පසුකාලය වන විට ඔහු තමාගේ හුදු පුද්ගල අවශ්‍යතා සඳහා පමණක් වෙහෙසීම ඉක්මවා ගියේ ය. එහි දී සිය කුටුම්භ පෝෂණයෙන් පමණක් සෑහීමට පත් නො වූ මානවයා ඉන් ඔබ්බට ගොස් තමා ජීවත් වන සමාජයේ විවිධ අවශ්‍යතා සඳහා අවැසි යම් යම් කටයුතුවල ද නිරත වන්නට විය. පුද්ගලයෙකු තම ජීවනෝපාය සඳහා නිරත වූ එම ක්‍රියාව කාලයාගේ ඇවෑමෙන් වෘත්තියක් බවට පත්විය. ඒ අනුව මානව ඉතිහාසයේ ආරම්භයේ සිට ම මිනිසා යම් යම් වෘත්තීන්වල යෙදෙනු දැක ගත හැකි ය . ඒ සෑම වෘත්තියක ම එහි ආරම්භය, විකාශය, වෘත්තීය අපේක්ෂාවන් සහ අභියෝග ද දැක ගත හැකි විය. මානව සමාජයේ සාර්ථක ගමනට එරෙහිව පැන නගින ගැටලුවලට විසඳුම් සෙවීම එම වෘත්තීයේ යෙදෙන්නන්ගේ හා වෘත්තීය සංවිධානවල සෑම සාමාජිකයෙකුගේ ම අභිප්‍රාය යි. සමස්ත ලෝකවාසීන් විසින් බිහි කරනු ලබන දැනුම නැතහොත් සාහිත්‍යය වෙත පිවිසීම, කළමනාකරණය, හා සංනිවේදනය පුස්තකාලයාධිපතිත්වයේ හරය යි. මෙම ලිපියෙන් පුස්තකාලයාධිපතිත්වයේ වෘත්තීයභාවය පිළිබඳ අපේක්ෂාවන් හා අභියෝගයන් අවධාරණය කරමින් සාකච්ඡා කරන අතර එයට බලපාන සාධක කිහිපයක් ද හඳුනා ගනිමින් ඒවාට විසඳුම් යෝජනා ඉදිරිපත් කරීම ද සිදුවේ. මෙහි දී පුස්තකාලයාධිපතිත්වයේ වෘත්තීයභාවය කෙරෙහි මූලිකව ම අවධානය යොමු කරමින් පුස්තකාලයාධිපතිවරුන්ගේ කාර්යයන්, අභියෝග සහ ඉදිරි මාවත කෙරෙහි ද සලකා බලනු ලැබේ. වෘත්තියක්, වෘත්තීය සහ වෘත්තීයභාවය පිළිබඳ දළ විශ්ලේෂණයක් සිදු කරන අතර වෘත්තියේ ලක්ෂණ, වෘත්තියක් ලෙස පුස්තකාලයාධිපතිත්වය, වෘත්තීය ආචාරධර්ම, පුස්තකාලයාධිපතිත්වයේ අභියෝග, පුස්තකාල වෘත්තිය මුහුණ දෙන බාධක සහ ඒවා ජයගත හැකි ආකාරය පිළිබඳ යෝජනා හා විසඳුම් ඉදිරිපත් කිරීමට ද මෙම ලිපියෙන් අපේක්ෂා කෙරෙයි.

**ප්‍රමුඛ පද:** *වෘත්තිය හා වෘත්තීයභාවය, පුස්තකාලයාධිපති, පුස්තකාලයාධිපතිවරුන්ගේ කාර්යභාරය, පුස්තකාලයාධිපතිවරුන්ගේ අභියෝග*

## 1. හැඳින්වීම

"වෘත්තිය" යන පදයට විවිධ ගුරුකුල විසින් විවිධ වූ අර්ථකථන සපයා ඇත. වෘත්තියක් යනු රැකියාවක් ලෙස සිදු කරනු ලබන කිසියම් ක්‍රියාකාරකමක් හෝ ක්‍රියාකාරකම් සමූහක එකතුවක් ලෙස සරලව අරුත් ගැන්විය හැකි ය. සියලු ම වෘත්තීන් රැකියාවන් වන නමුත් සියලු ම රැකියාවන් වෘත්තීන් වන්නේ නැත. වෘත්තියක් යනු විශේෂිත වූ වෘත්තියක් හෝ ක්‍රියාකාරකමක් වන අතර එය මානව වර්ගයාට අදාළ කර ගැනීමට හා සේවය කිරීමට අදහස් කරන විශේෂිත දැනුමකින් යුක්ත ක්ෂේත්‍රයක මනා අධ්‍යාපනයකින් හා පුහුණුවක් මගින් හික්මවනු ලැබූ විනයකි. ඓතිහාසික යුගවල පැවතියේ ප්‍රමුඛ වෘත්තීන් තුනක් පමණි. දේවත්වය, වෛද්‍ය විද්‍යාව සහ නීතිය එම වෘත්තීන් තුන යි. පසුකාලය වන විට එයට විවිධ වෘත්තීන් එක් වනු දක්නට ලැබිණි. " වෘත්තිය" යන වචනයේ ඓතිහාසික පදනම පරීක්ෂා කරන විට එය පිළිගැනීම හෝ

ප්‍රකාශ කිරීම වන අතර එම පිළිගැනීම පූජකයෙකු විසින් ගනු ලැබූ පොරොන්දුවක් වූ බව පෙනී යයි.

පසුව එය වෛද්‍යවරුන් විසින් ගනු ලැබූ හිපොක්‍රටික් දිවුරුම හා බැරිස්ටර්වරයකු විසින් කරන ලද දිවුරුම සමඟ සම්බන්ධ විය. ඉන්පසු මෙම පදය ආගමික පූජකයින්ගේ හෝ වෛද්‍යවරයෙකුගේ හෝ නීති ක්ෂේත්‍රවල ක්‍රියාකාරකම් සමඟ සම්බන්ධ විය. මෙසේ මෙම ශාස්ත්‍රීය වෘත්තීන් අතරට වෛද්‍ය විද්‍යාව, සිවිල් ඉංජිනේරු විද්‍යාව, ගෘහ නිර්මාණ ශිල්පය සහ ගිණුම්කරණය වැනි අංශයන් එක් වන්නට විය. 19වන ශත වර්ෂය ආරම්භයත් සමගම තාක්ෂණයේ වර්ධනය හා වෘත්තීය විශේෂීකරණය වීමත් සමග ම අනෙකුත් ආයතන ද වෘත්තීය තත්ත්වයට හිමිකම් කීමට පටන් ගත්තේ ය. උදාහරණ ලෙස ඖෂධවේදය, පශු වෛද්‍ය විද්‍යාව, හෙද, ගුරු, පුස්තකාලයාධිපති, දෘෂ්ටි විද්‍යාව සහ සමාජ වැඩ ආදිය පෙන්වා දිය හැකි අතර මේ සියල්ලට ම වෘත්තියකත්වයට පත්වීමට හැකි විය (Ahmad & Yaseen, 2009). මේ අනුව, විසිවන සියවස ආරම්භ වන විට පුස්තකාලයාධිපතිත්වය ඇතුළු නව විෂයයන් රැසකට වෘත්තියක් ලෙස තත්ත්වයක් සහ බලයක් ඉහළ නංවා ගැනීමට හැකි විය. සෑම වෘත්තියක් ම බලතල හා වරප්‍රසාද මාලාවක් ප්‍රදානය කරමින් ඇතැම් ක්ෂේත්‍රයන් තුළ තම වෘත්තියට බලය පැවරීමට ප්‍රජාව පොලඹවා ගැනීමට ද උත්සාහ දැරී ය. සමාජ පිළිගැනීමේ ස්වරූපය මත එය සමාජයට වාසිදායක වන පිළිගැනීමක් ලබා දෙන අතර වෘත්තියට මෙම පිළිගැනීම ලැබෙන්නේ එය සමාජයට ප්‍රයෝජනවත් වන නැතහොත් උපයෝගීතාවක් සහිත වූ ක්‍රියාවලියක් වන බැවිනි.

**2. පර්යේෂණ ගැටලුව**

අප ජීවත් වන වර්තමානය තොරතුරු සමාජයකි. ලොව ඇති සියලු සම්පත්වලට වඩා තොරතුරුවලට මෙම සියවසේ සුවිශේෂී අගයක් හිමිව ඇත. පුස්තකාලය හා තොරතුරුවල ස්වභාවය ද වේගයෙන් වෙනස් වේ. පුස්තකාල හුදෙක් දැනුමේ ස්ථිතික ගබඩා නිවාසවල සිට ගතික සේවා මධ්‍යස්ථාන දක්වා වෙනස් වී තිබෙනු දැකිය හැකි ය. බුද්ධිමය පරිසරයෙහි වෙනස් වීම් හමුවේ පුස්තකාල වෘත්තිය ද විශාල පරිවර්තන රැසකට භාජනය වී ඇත. එමෙන් ම තොරතුරු මාධ්‍ය ආකෘතීන් සහ අනුග්‍රාහකයන් යන මේ සියල්ල ම වෙනස් වී ඇති හෙයින් පුස්තකාලයාධිපතිවරයා මෙතෙක් ගත කළ තොරතුරු සංරක්ෂණ භූමිකාවෙන් ඔබ්බට ගොස් තොරතුරු විද්‍යාඥයෙකු ලෙස තම කාර්යභාරය සමාජයට ඉටු කිරීමේ යුගය දැන් උදා වී ඇත. කෙසේ වෙතත්, තොරතුරු ප්‍රභවයන් සහ අනුග්‍රාහකයන් අතර යාන්ත්‍රණය සම්බන්ධ කරන පුරුක වෘත්තිය විසින් සපයනු ලබන සේවාවන් පිටුපස ඇති මූලික දර්ශනය නොවෙනස්ව පවතී. මේ නිසා මෙම වෘත්තිය සැබවින් ම රැකියාවක් ද නැතහොත් වෘත්තියක් ද? යන්න පිළිබඳ ලොව පුරා විශාල කතිකාවක් නිර්මාණය වී තිබේ. මෙම වෘත්තිය සම්බන්ධයෙන් සමාජීය, බුද්ධිමය හා තාක්ෂණික ක්ෂේත්‍රවල දියුණුව මගින් වරින් වර බලපාන වෘත්තීය ක්‍රියාකාරකම් මොනවා ද? සාම්ප්‍රදායිකව පැවති එකතු කිරීම, සංවර්ධනය, සංවිධානය සහ ප්‍රවේශය සම්බන්ධ වෘත්තීය ක්‍රියාකාරකම් නව පරිසරයට අනුකූල නව නිපුණතා ඇති කර ගැනීමෙන් මෙම වෘත්තියට නිසි වටිනාකමක් ලබාගත හැකි ද? එපමණක් නොව, අනාගතයේ පුස්තකාල වෘත්තිකයා මුහුණ දෙන අභියෝග කවරේ ද? යනාදි කරුණු සම්බන්ධයෙන් ලොවපුරා සංවාදයක් පවතී. එහෙත් මෙම විෂය පිළිබඳව ඇති පර්යේෂණ සාහිත්‍ය තවමත් ප්‍රමාණවත් තරම් පාඨකයා හමුවට පැමිණ ඇත් ද යන්න

ගැටලුවකි. මෙම රික්තය යම් පමණකට පූරණය කිරීමේ අරමුණෙන් මෙම සාහිත්‍යමය සොයාබැලීම සිදු කරනු ලබයි.

### 3. අධ්‍යයන ක්‍රමවේදය

මෙම අධ්‍යයනයේ දී ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන ලද්දේ පුස්තකාලයාධිපති රැකියාව වෘත්තියක් ලෙස පිළිගැනීම හෝ නොපිළිගැනීම සම්බන්ධයෙන් ඇති මතවාද පිළිබඳව අවධානය යොමු කිරීමට ය. එසේ ම එම වෘත්තියෙහි වෘත්තික භාවය පිළිබඳව ඇති සාහිත්‍යමය තොරතුරු විශ්ලේෂණයකට ලක්කිරීම ද මෙහි දී සිදුකරන ලදි. ඒ අනුව මෙම විෂය සම්බන්ධයෙන් ජාතික හා ජාත්‍යන්තර සාහිත්‍යයේ පවතින ලිපි ලේඛන කිහිපයක් විමර්ශනය කරනු ලැබී ය. විවිධ සමාජ මානව විද්‍යාඥයින් හා පුස්තකාල විද්‍යාඥයින් පළ කර ඇති අදහස් සහිත පර්යේෂණ මෙහි දී පරිශීලනය කරන ලදී. එම ලිපිවල ඇති වෘත්තික භාවය සම්බන්ධ අදහස් හා විග්‍රහයන් අවධානයට ලක්කරමින් ඒවා තවදුරටත් විශ්ලේෂණයකට ලක්කිරීම ප්‍රමුඛ අභිප්‍රාය විය. ඒ අනුව වෘත්තිය හා වෘත්තිකභාවය සම්බන්ධ නිර්වචන හා ඒවා පුස්තකාල වෘත්තිය සම්බන්ධයෙන් කෙතෙක් දුරට සමපාත වන්නේ ද යන්න මෙන් ම මෙම වෘත්තිය වර්තමානයේ මුහුණ දෙන අභියෝග පිළිබඳව සාහිත්‍යයේ ඇති තොරතුරු කෙරෙහි අවධානය යොමුකරමින් සාහිත්‍ය ගවේෂණාත්මකව මෙම අධ්‍යයනය සිදු කරන ලදි.

### 4. අධ්‍යයනයේ ප්‍රතිඵල හා විශ්ලේෂණය

#### 4.1 වෘත්තිය හා වෘත්තීයභාවය

කිසියම් වෘත්තියක් යනු සමාජීය අවශ්‍යතාවක් අරභයා නිර්මාණය වූවකි. එය කිසියම් සමාජ කොටසක අපේක්ෂා මුදුන් පමුණුවා ගැනීම අරමුණු කොට පවතී. එය සමාජයට විශේෂ සේවාවක් සැපයීම අරමුණුකොට පවතින අතර එය එහි නිරත වන්නාට ජීවන මාර්ගයක් බවට ද පත්වේ. ඒ සඳහා ඔහුට හෝ ඇයට විශේෂිත වූ බුද්ධිමය පරිචයක් තිබිය යුතු ය. මේ නිසා ඕනෑ ම පුද්ගලයෙකුට කිසියම් වෘත්තියක නිරත වීමේ අයිතිවාසිකම පවතින අතර ඒ සඳහා පුහුණුවක් ද ලැබීම අත්‍යවශ්‍ය වේ.

'profession' යන පදය, ඉංග්‍රීසි භාෂාවට ව්‍යුත්පන්න වී ඇත්තේ ලතින් භාෂාවේ '*profiteor,*' යන වචනයෙනි. එහි අර්ථය වන්නේ "ආධ්‍යාත්මික දිවුරුමක් ලබා දීමේ අර්ථයෙන් විධිමත් කැපවීමක් කිරීම" යන්න යි. වෘත්තිය හෝ රැකියාව, ව්‍යාපාරය යන යෙදුම් වෘත්තිය යන යෙදුමට සමානව භාවිත වේ. නමුත් වෘත්තියකට සුවිශේෂී ලක්ෂණ ඇති අතර වෘත්තිය රැකියාවෙන් වෙනස් වේ. රැකියාව යන්නෙන් අදහස් කරන්නේ කෙනෙකුගේ ජීවනෝපාය යි. නැතහොත් පුද්ගලයෙකු තම දිවි පැවත්ම සඳහා යම් ක්‍රියාවක නිරත වීම යි. ජීවනෝපාය පිරමීඩයේ වඩාත් ම පහළ ම ස්ථානය රැකියාවෙන් ආරම්භ වී වෘත්තියක් දක්වා ගමන් කරයි. වෘත්තිය යනු පුද්ගලයාගේ පැත්තෙන් ප්‍රායෝගික කුසලතා ඉල්ලා සිටින රැකියාවකි. වෘත්තිය යන පදය විවිධ චින්තන ගුරුකුල විසින් විවිධ වෙනස්කම්වලින් යුක්තව අර්ථකථන ඉදිරිපත් කොට ඇත. එවැනි පිළිගත් නිර්වචන කිහිපයක් පහත සාකච්ඡා කෙරේ.

මෙරියම්-වෙබ්ස්ටර් ඔන්ලයින් ශබ්දකෝෂය වෘත්තියක් අර්ථ දක්වන්නේ "විශේෂිත දැනුම හා බොහෝ විට දීර්ඝ හා දැඩි අධ්‍යයන සූදානමක් අවශ්‍ය වන රැකියාවක්" ලෙස

යි. වෘත්තිකයන් සූදානම් කිරීම සඳහා සුදුසු අධ්‍යාපනයක් ලබා දීම අවශ්‍ය බව මෙම අර්ථ දැක්වීමෙන් පෙනී යන අතර අධ්‍යාපනය ගැඹුරු හා පුළුල් විය යුතු බවට ද, විද්‍යාව හා අධ්‍යාපනය වෘත්තිය හා සෘජු සම්බන්ධයක් පෙන්නුම් කරන බවට ද එහි තව දුරටත් අවධාරණය කෙරෙයි. මේ අනුව විචක්ෂණ දැනුමක් සහිත ඊකියාව වෘත්තියක් වන අතර එම වෘත්තිය සමාජයේ සෙසු අයගේ ප්‍රයෝජනය උදෙසා යෙදවිය යුතු ය. එය භාවිතයේ දී විශේෂ ක්‍රමවේදයක්, ශිල්පීය ඥානයක් අවශ්‍ය වේ. මෙම නිර්ණායකයට අනුව වෘත්තිකයා හොඳින් සූදානම් කිරීමෙන් ඔහුට හෝ ඇයට සමාජයට ඉතා පුළුල් සේවාවක් කිරීමට හැකි වේ.

ඔක්ස්ෆර්ඩ් ඉංග්‍රීසි ශබ්දකෝෂයෙහි වෘත්තිය (profession) යන පදයට අරුත් සපයා ඇත්තේ විශේෂ පුහුණුවක් හෝ නිපුණතාවක් අවශ්‍ය ඊකියාවක් වශයෙනි (Oxford Online Dictionary, 2008). ඒ සඳහා විශේෂයෙන් ඉහළ මට්ටමේ අධ්‍යාපනයක් අවශ්‍ය වන බව ද එහි තව දුරටත් පෙන්වා දී ඇත. එසේ ම සේවා දායකයා විසින් තමන් ලබා ගන්නා සේවාව වෙනුවෙන් කිසියම් ගාස්තුවක් ගෙවනු ලබයි. කිසියම් ක්ෂේත්‍රයක් හෝ විද්‍යාවක් පිළිබඳ විශේෂ දැනුමක් වෘත්තිකයාට හිමි ය. වෙනත් වචනවලින් කියතොත් වෘත්තීයවේදීන් සමාජයට සේවා සපයයි. ඔහුගේ හො ඇයගේ විශේෂිත දැනුම සහ කුසලතා ඒ සඳහා පාදක වේ. මෙම නිර්වචනයට අනුව ද ඉහත කී ආකාරයට ම වෘතිකයාට විශේෂ ඥානයක් නැතහොත් න්‍යායාත්මක හා ප්‍රායෝගික ශික්ෂනයක් අවශ්‍ය බව පෙන්නුම් කරයි. එසේ ම වෘත්තිකයාට තම වෘත්තීය සේවාව වෙනුවෙන් සේවා ලාභියාගෙන් ගෙවීමක් ලබා ගැනීමේ අවකාශය ද හිමි වේ (Evetts, 2003). මෙම නිර්වචනයට අනුව ද ඉහත කී ආකාරයට ම වෘත්තිකයාට විශේෂ ඥානයක් නැතහොත් න්‍යායාත්මක හා ප්‍රායෝගික ශික්ෂණයක් අවශ්‍ය බව පෙන්නුම් කරයි. එසේ ම වෘත්තිකයාට තම වෘත්තීය සේවාව වෙනුවෙන් ගෙවීමක් ලබා ගැනීමේ අවකාශය ද හිමි වේ.

වෘත්තිකයා යන්න සමාජ විද්‍යාව පිළිබඳ ශබ්දකෝෂයේ දැක්වෙන ආකාරයට විශ්වවිද්‍යාලයක් හෝ වෙනත් උසස් අධ්‍යාපන ආයතනයකින් ලබාගත් දැනුම සහිත පුද්ගලයකු වන අතර, 'සේවාදායකයින්' සම්බන්ධයෙන් සැලකිය යුතු බලයක් ද ඔහු සතුව පවතී. එවැනි දැනුමක් උපයෝගී කරගනිමින් සිදු කරන ක්‍රියාකරකම වෘත්තිය යි (Evetts, 2003). මෙම ශබ්දකෝෂයේ තව දුරටත් විස්තරකරන ආකාරයට වෘත්තියෙන් වෘත්තිය වෙනස් වන්නේ ඉහළ මට්ටමක පවත්වනු ලබන විශේෂිත පුහුණුවකින් ලබා ගත් න්‍යායාත්මක දැනුමෙනි.

### 4.2 පුස්තකාලය හා පුස්තකාලයාධිපතිත්වය

සමස්ත ලෝකවාසීන් විසින් බිහි කරනු ලබන දැනුම නැතහොත් සාහිත්‍ය වෙත පිවිසිම, කළමනාකරණය හා සංනිවේදනය පුස්තකාලයාධිපත්ත්වයේ හරය යි. පුස්තකාලයට හා පුස්තකාලයාධිපතිත්වයට දිගු ඉතිහාසයක් ඇත. එය අදින් වසර දහස් ගණනකට පෙර සිට ම සමාජීය ආයතනක් ලෙස ක්‍රියාත්මක විය. ගංගා නිම්න ආශ්‍රිතව මානව ශිෂ්ටාචාර බිහි වීමත් සමග ම අතීත මානවයා තමන් සතු දැනුම මීළඟ පරපුරට සම්ප්‍රේෂණය කිරීමේ අවශ්‍යතාව ද තේරුම් ගෙන කටයුතු කර ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රජාතාන්ත්‍රික සමාජීය ආයතනයක් ලෙස පුස්තකාල බිහි විය. අතීතයේ

මෙසපොතේමියානු පුස්තකාලවල මැටි පුවරු ලේඛන දහස් ගණනින් සංරක්ෂණය කර තිබීමෙන් මෙය මනාව තහවුරු වේ. මෙසපොතේමියාවේ සහ බැබිලෝනියානු ශිෂ්ටාචාරවල පුස්තකාලයාධිපතිත්වය රැකියාවක් ලෙස සලකා තිබෙනු දක්නට ලැබිණි. තක්ෂිලා, නාලන්දා මෙන් ම ඇලෙක්සැන්ඩ්‍රියාව සහ රෝමයේ ද පුස්තකාල පැවති අතර ඒවා පුස්තකාලයාධිපතිවරුන් විසින් පාලනය කරන ලදි (වීරසිංහ, 2001). පුස්තකාලයාධිපතිවරුන්, රජවරු සහ ආරාම විසින් පවත්වාගෙන යනු ලබන පුස්තකාලවල සේවයේ යොදවා ඇත. මේ අනුව පුස්තකාල වෘත්තිය රැකියාවක් ලෙස අතීතයේ ක්‍රියාත්මක වී තිබේ. මධ්‍යකාලීන යුගයේ දී පුස්තකාල, විද්වතුන් විසින් කළමනාකරණය කොට පවත්වාගෙන යන ලදී. ආරම්භක අවධියේ දී ඔවුන් සංවිධානාත්මක දැනුම සඳහා විශේෂ කුසලතා වර්ධනය කළ අතර එය පරිශීලකයාට අනුව වෙනස් විය. මෙම කුසලතා බොහොමයක් විද්‍යාත්මක පදනමකින් තොර අත්හදා බැලීම් සහ දෝෂ සහිතව ගොඩ නැගී තිබිණි. ඒ අනුව පුස්තකාලයාධිපතිත්වය වෘත්තියක් ලෙස නොව රැකියාවක් ලෙස මෙකල පවත්වාගෙන ගොස් ඇති බව දක්නට ලැබේ. කාර්මික විප්ලවය හා ගෝලීයකරණය සමඟ අධ්‍යාපනයේ දැනුම නිෂ්පාදනය ඉහළ ගොස් ඇති අතර පුස්තකාල අධ්‍යයන ආයතනවල දැනුම ලබා දීමේ මධ්‍යස්ථාන ලෙස සලකා ඇත.

නූතන ලෝක දියුණුවේ අසමසම බලවේගය ලෙස ලේඛන කලාව හඳුනා ගත හැකි ය. නව දැනුම සංරක්ෂණය කොට තබා ගැනීම සඳහා ලේඛනය සහ ලේඛන මාධ්‍ය සොයා ගැනීම නිසා කාලයේ සහ අවකාශයේ බාධක ඉක්මවා අනාගතය සඳහා වාර්තාගත තොරතුරු සංරක්ෂණය කිරීමේ හැකියාව ලැබුණි. කඩදාසි සහ මුද්‍රණය සොයා ගැනීම නිසා මෙය තව තවත් වේගවත් විය. ඉහත පෙන්වා දුන් පරිදි විසිවන ශත වර්ෂයේ විවිධ වෘත්තීන් බිහි වූ අතර පුස්තකාලයාධිපතිත්වය ද ඒ අතර වේ. මුද්‍රිත හා මුද්‍රිත නොවන මාධ්‍ය හරහා සන්නිවේදනයේ යාන්ත්‍රණය දියුණු වූ අතර පුස්තකාලය හරහා එය නිසි පරිදි ආයතනිකකරණය වී ඇත. සරලව කිවහොත් පුස්තකාලය සන්නිවේදන නාලිකාවක් වන අතර පුස්තකාලයාධිපතිවරයා සන්නිවේදනයේ මැදිහත්කරු බවට පත් වී ඇත. පුස්තකාලයාධිපතිත්වය විද්‍යාව (දැනුමේ ශරීරය) සහ කලාව (කුසලතා) ලෙස වර්ධනය වන්නට විය. පුස්තකාල වෘත්තියේ ආදර්ශ පාඨය බවට පත්වන්නේ පරිශීලකයින්ගේ අවශ්‍යතා හා ඉල්ලීම් සපුරාලීම යි. කෙසේ වෙතත් විවිධ මාධ්‍යයන්ගෙන් ආරම්භ වී මුද්‍රණයේ සිට ඩිජිටල් (digital) දක්වා පුස්තකාල සම්පත් වෙනස් වී ඇත. සාම්ප්‍රදායික යොමු සේවාවේ සිට අන්තර්ජාලය පදනම් කර ගත් සේවාවන් දක්වා වෙනස් වන සේවාවන් රැසක් වත්මන් පුස්තකාලයට ඉටු කිරීමට සිදු වී ඇත. සමාජයේ සාමාජිකයන් අතර දැනුවත් භාවය ගොඩනැගීම, තොරතුරු පරිසරයේ සිදුවන වෙනස්කම්වලට හැඩගැසීම, පාඨකයන්ට උපකාර කිරීම මෙන් ම ඊටත් වඩා තීරණාත්මක කාර්යභාරයක් වර්තමානයේ පුස්තකාලයාධිපතිත්වයට හිමිව ඇත. පුස්තකාල වෘත්තියේ මූලික පරමාර්ථය වන්නේ පරිශීලක ඉල්ලීමට අදාළ තොරතුරු ඉතා වේගයෙන් ලබා දීම සහ එමඟින් පරිශීලක තෘප්තිය ළඟා කර දීම යි. එබැවින් පුස්තකාලයාධිපතිත්වය සේවා මත පදනම් වූ වෘත්තියකි. බොහෝ පුස්තකාල විද්‍යාඥයින් මෙම මූලික අරමුණ තබා ගනිමින් පුස්තකාල වෘත්තිය විවිධ ආකාරවලින් අර්ථ දක්වා ඇත (වීරසූරිය, 2000). එය සාරාංශයක් ලෙස ගත හොත් පුස්තකාලයාධිපතිත්වය පුස්තකාල කළමනාකරණය කිරීමේ විද්‍යාව හා කලාව වශයෙන් හඳුන්වාදිය හැකි ය.

පර්යේෂකයින් "වෘත්තිය" සහ "වෘත්තීය" යන වචන විවිධාකාරයෙන් භාවිත කොට ඇත. ඩාකෝල් (Dakhole)ට අනුව හැරෝඩ් පුස්තකාල විද්‍යාව අර්ථ දක්වා ඇත්තේ " පුස්තකාල සහ තොරතුරු ඒකක අධ්‍යයනය කිරීම, සමාජයේ ඔවුන් ඉටු කරන කාර්යභාරය, ඒවායේ විවිධ සංරචක හා ක්‍රියාවලීන් සහ ඒවායේ ඉතිහාසය හා අනාගත සංවර්ධනය සඳහා වූ සාමාන්‍ය යෙදුමක් වශයෙනි. පුස්තකාලයාධිපතිත්වය විස්තර කර ඇත්තේ "සියලු ආකාරයේ කියවීම් සහ අධ්‍යාපනය දිරිමත් කරන වෘත්තියක්" ලෙස යි (Dakhole, 2004). පුස්තකාලයාධිපතිත්වය යනු ඉගෙනීමේ ම ශාඛාවක් වන අතර එය සම්පත් හඳුනා ගැනීම, එකතු කිරීම, සංවිධානය කිරීම, සංරක්ෂණය හා භාවිතය සමඟ සම්බන්ධ වේ. පුස්තකාලයාධිපතිත්වය යනු මිනිස් දැනුමේ අංශයකි, එය වෘත්තියකි, තොරතුරු හෝ දැනුම සඳහා මෙවලමකි, එයට සමාජ සේවය සම්බන්ධ වේ. එය හුදු ශිල්පයක් පමණක් නොව විද්වතුන්ගේ දෙපාර්තමේන්තුවක් යනුවෙනි (රණසිංහ, 1993).

කාලයාගේ ඇවෑමෙන් පුස්තකාල වෘත්තියේ න්‍යාය හා භාවිතයේ ප්‍රබල වෙනසකම් රැසක් සිදු වී ඇත. භාරකරුවෙකු ලෙස ආරම්භ කළ මෙම වෘත්තිය දැනුමේ සංවිධායකයෙකු හා තොරතුරු සම්ප්‍රේෂකයෙකු දක්වා වර්ධනය වී ඇති අතර වර්තමානයේ මෙම වෘත්තිය තොරතුරු විද්‍යාඥයෙකු දක්වා උසස් වී ඇත. සමාජයේ ඉල්ලීම් හා සන්නිවේදනයේ වේගවත් ව්‍යාප්තියට අනුකූලව පුස්තකාලයාධිපති සංකල්පය වෙනස් වෙමින් පවතී. පුස්තකාලයාධිපතිත්වයේ සමස්ත ඉතිහාසය ම විවිධ අදියර සහිත පුළුල් මං සලකුණු සනිටුහන් කරයි. පුස්තකාලයාධිපතිත්වයේ පළමු අදියර සමන්විත වූයේ "දැනුමේ සම්පත්වල භාරකාරත්වය" මගිනි. එම අවධියේ සිට එය සමකාලීනව දැනුමේ කළමනාකරු සහ ඩිජිටල් පුස්තකාලයාධිපතිගේ භූමිකාවන් දක්වා ප්‍රසාරණය වී ඇත.

සමාජ ආයතනවල චලනයන් හා අවට සමාජයේ සිදු වන වෙනස්කම්වල බලපෑම් ඇති වන අතර පුස්තකාලය ද ඊට සාපේක්ෂව වෙනස් වේ. මාධ්‍ය විප්ලවය, පරිගණක හා සන්නිවේදන තාක්ෂණය, පරිශීලක ප්‍රජාවේ වෙනස් වන හැසිරීම් සහ පුස්තකාලවල වැඩි වන සමාජ වගකීම් පුස්තකාල වෘත්තියට විශාල බලපෑමක් ඇති කර තිබේ. වර්තමාන පුස්තකාලයාධිපතිවරයා කළමනාකරණය වැනි නව වගකීම් ද දරයි. තොරතුරු ජාල සහ මාර්ගගත සේවීම් පැවැත්වීම, ඩිජිටල් සංරක්ෂණය කළමනාකරණය කිරීම සහ ඩිජිටල් පුස්තකාල සංවර්ධනය කිරීම වර්තමාන තොරතුරු ලෝකයේ මෙම වෘත්තිය වඩාත් ක්‍රියාශීලී හා අර්ථවත් කිරීමට හේතු වී ඇත.

පුස්තකාලයාධිපති උපදේශකයෙකු ලෙස ක්‍රියා කරයි. පුස්තකාල හා තොරතුරු වෘත්තිය හා අදාළ පරිශීලකයාගේ තොරතුරු අවශ්‍යතා සඳහා නියෝජිත පරිවර්තකය සහ මැදිහත්කරු බවට පත්වෙයි. මේ අනුව ඉටු කරන ලද කාර්යය වර්තමාන තොරතුරු වෘත්තිකයන් අනුව, අතීතයට වඩා ආකෘතිමය වශයෙන් බෙහෙවින් වෙනස් හා අභියෝගාත්මක බවට පත්ව ඇති බව පෙනීයයි. මේ අනුව, පුස්තකාල වෘත්තිය වර්තමානයේ නව අනන්‍යතාවක් ලබා ගෙන ඇත. පුස්තකාල වෘත්තිකයන් දැන් වෙබ්මාස්ටර්වරුන්, ජාල පරිපාලකයින් හා කළමනාකරුවන්, තොරතුරු සාක්ෂරතා සපයන්නන්, තොරතුරු පහසුකම් සපයන්නන් යනාදී වශයෙන් විවිධ භූමිකා ඔස්සේ හඳුනා ගත හැකි ය.

ලෝකය පුරා නව දැනුම හෙවත් සාහිත්‍ය ඉතා වේගයෙන් බිහි වෙයි. එසේ බිහිවන දැනුම හෙවත් සාහිත්‍ය වෙත පරිශීලකයන් නැතහොත් පාඨකයින් යොමු කිරීම, රැස් කර

ගත් ඥාන සම්භාරය කළමනාකරණය කිරීම හා සංනිවේදනය පුස්තකාලයාධිපතිත්වයේ මූලික වගකීම යි. පුස්තකාලයාධිපතිත්වය නූතන සමාජයේ සුවිශේෂී හා කැපී පෙනෙන වෘත්තියකි. ඔවුන් රාජ්‍ය හා වෙනත් අංශයන්හි සේවයේ නිරත වන අතර ජාතික සංවර්ධනය සඳහා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. පුස්තකාලයාධිපති වෘත්තිය නූතනයේ ඇතැම් අවස්ථාවල "පුස්තකාල හා තොරතුරු වෘත්තිය" ලෙස හැඳින්වේ. සමාජයේ වෙනස්වන තොරතුරු අවශ්‍යතා සැලකිල්ලට ගනිමින් පුස්තකාලයාධිපති සංකල්පය වෙනස් වී ඇත. පුස්තකාලයාධිපතිත්වය වෘත්තියක් ද නැද්ද යන්න පිළිබඳ දීර්ඝ කාලයක් තිස්සේ වාද විවාද සිදු කරමින් පවතී. මේ පිළිබඳව ඇති එක් මතයක් නම් එය වෘත්තියක් නොවන අතර වෘත්තියක් හා වෘත්තියක් අතර පවතින අතර මැදි තත්ත්වයක් බව යි. වෛද්‍ය වෘත්ති සහ එවැනි අනෙකුත් වෘත්තීන් පෞරාණික වෘත්තීන් වන අතර ඇතැම් අවස්ථාවල වෘත්තික බවක් නොපෙන්වන වෘත්තීන් පවා වෘත්තීන් ලෙස පිළිගෙන ඇතත් පුස්තකාලයාධිපතිත්වය එසේ පිළිගෙන නොමැත.

පුස්තකාලයාධිපතිත්වය වෘත්තියක් වීම පිළිබඳව සමාජ විද්‍යාඥයින් විසින් විවිධ මත ප්‍රකාශ කර ඇත. පුස්තකාල සේවාවන්හි වෘත්තීයභාවය සමඟ එකඟ නොවන අය ද සිටිති (Lancour, 1962). පුස්තකාලයාධිපතිවරුන්ගේ සේවය නීතිගත වෘත්තියක් නොවීම, වෛද්‍යවරුන්ගේ සේවය තරමට සමාජයට අවශ්‍ය නොවීම, ඔවුන්ගේ කීර්තිය උපයා ගැනීම සඳහා විශ්වාසයෙන් යුතුව සමාජයට සේවය කිරීමට ඔවුන්ට ඇති නොහැකියාව, ඔවුන්ට සේවාදායකයින් සමඟ සැබෑ අධිකාරියක් ක්‍රියාත්මක කිරීමට නොහැකිවීම වැනි හේතු මත පුස්තකාලයාධිපතිත්වය වෘත්තියක් ලෙස පිළිගෙන නැත. සිල්ස්ගේ නිරීක්ෂණයට අනුව "සමාජ විද්‍යා පිළිබඳ ජාත්‍යන්තර විශ්වකෝෂයේ පවා පුස්තකාලයාධිපති වෘත්තිය, වෘත්තීය ලැයිස්තුවට ඇතුළත් කර නැත (Sills, 1962).

### 4.3 පුස්තකාලයාධිපතිවරයාගේ කාර්යභාරය

පුස්තකාලයාධිපතිවරයා මානව වර්ගයාගේ සංස්කෘතික හා බුද්ධිමය උරුමය සංරක්ෂණය කරන අතර තොරතුරු උත්පාදනයේ සිට භාවිතයට ගන්නා ස්ථානය දක්වා සන්නිවේදනයේ නියෝජිතයෙකු ලෙස ක්‍රියා කරයි. තොරතුරු හුවමාරු ක්‍රියාදාමයේ දී ඔහුගේ සේවාවන් අත්‍යවශ්‍ය වේ. මෙම මතය මෙල්විල්, බට්ලර්, ග්‍රීන්වුඩ්, ෂැෆර් සහ වෙනත් සමාජ මානව විද්‍යාඥයින් හා තොරතුරු විද්‍යාඥයින් විසින් අවධාරණය කර ඇති අතර පුස්තකාලයාධිපතිත්වය වෘත්තියක් බව ඔප්පු කිරීමට ද ඔවුන් උත්සාහ කොට ඇත (ආනන්ද තිස්ස, 2019). රොබට් දක්වා ඇත්තේ සාධක කිහිපයක් මත පුස්තකාලයාධිපතිවරුන්ගේ වෘත්තීය තත්ත්වය පිළිගෙන ඇති බව යි. අප සමාජයේ වෘත්තීයමය වශයෙන් ප්‍රමුඛතම සේවාවක් ලෙස පුස්තකායාධිපතිත්වය හඳුනාගෙන ඇත.

නූතන පුස්තකාල පරිශීලකයාගේ නවීන ස්වභාවය නිසා විසිඑක්වන සියවස පුස්තකාල හා තොරතුරු විද්‍යා වෘත්තිය තුළ විශාල ගතිකත්වයක් පෙන්නුම් කරයි. නූතන පුස්තකාල පාඨකයින් ඉතා වේගයෙන් ගලා එන නවීන තාක්ෂණය වැලඳ ගන්නා නිසා පුස්තකාලයාධිපතිවරුන්ට ඔවුන්ගේ සේවා සැපයීමේ දී වඩාත් ක්‍රියාශීලී විය යුතුව ඇත. අන්තර්ජාලයේ පැමිණීමත් සමග ම පුස්තකාලයාධිපතිවරුන්ට තව තවත් සිය සේවා සැපයීම වේගවත් කිරීමට සිදු වී ඇත. පුස්තකාලයාධිපතිත්වයේ අත්‍යවශ්‍ය කාර්යභාරය වන්නේ එදිනෙදා තොරතුරු සොයන ජනතාවගේ ප්‍රයෝජනය සඳහා "තොරතුරු" එහි පුළුල් අර්ථයෙන් ලබා දීම, විවේකය හා සේවා අවශ්‍යතා සැපයීම වේ.

පුස්තකාලයාධිපතිත්වය මූලික වශයෙන් සැලකිලිමත් වන්නේ දැනුම ගබඩා කිරීම, සංවිධානය කිරීම, සහ ලේඛන වෙත ප්‍රවේශ වීමට අවශ්‍ය පහසුකම් ලබාදීම ය. ඒවා නම් තොරතුරු මූලාශ්‍රය (ලේඛන) එක් රැස් කිරී කිරීම, ලේඛන සංවිධානය කිරීම සඳහා තාක්ෂණික පහසුකම් සැපයීම, ලේඛන සඳහා යොමු කිරීම සහ ග්‍රන්ථ නාමාවලිය ලබා දීම, කියවීම සඳහා භෞතික පහසුකම් සැපයීම, පුස්තකාල භාවිත කරන්නන්ගේ දැනුම හැසිරවීම සඳහා අවශ්‍ය විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වශයෙනි.

15වන ශතවර්ෂයේ මුද්‍රණ යන්ත්‍රය සොයා ගැනීමත් සමඟ පුස්තකාලවල ආරක්ෂිතයාගේ ක්‍රියාකාරිත්වය සඳහා අවශ්‍යතාව අඩු විය. පුස්තකාලයාධිපතිවරයාගේ කාර්යය පොත් භාරකරුගේ සිට තොරතුරු හා දැනුම එකතු කිරීමේ කළමනාකරු දක්වා වෙනස් විය (ගුණසේකර, 1998).

කාලයාගේ ඇවෑමෙන් පුස්තකාල දර්ශනය වෙනස් වූ අතර පුස්තකාල සම්පත් භාවිතයට ගැනීම හා පොත් සංසරක්ෂණය කිරීම ආරම්භ විය. විසිවන සියවසේ දී දැනුම විසරණය කිරීමේ ක්‍රියාවලිය තුළ පුස්තකාලයේ ප්‍රධාන කාර්යය වූයේ පොත් බැහැරදීමේ ක්‍රියාවලිය යි. දැනුම සම්ප්‍රේෂණය කිරීමේ ක්‍රියාවලියේ දී පුස්තකාලයාධිපතිවරයා, කතුවරයා සහ අවසාන පරිශීලකයා (පාඨකයා) අතර මැදිහත්කරුවෙකු ලෙස පෙනී සිටියේ ය. පුස්තකාල සම්පතෙහි උපයෝගීතාව රඳා පවතින්නේ පුස්තකාලය මෙහෙයවීම, ක්‍රියාත්මක කිරීම සහ කළමනාකරණය කරන පුද්ගලයින්ගේ කුසලතා සහ දැනුම මත ය. එබැවින් මානව නියෝජිත ආයතනයක් වන පුස්තකාලයේ පුස්තකාලයාධිපතිවරයා, අදාළ තොරතුරු සැපයීම සහ එය භාවිත කිරීම සඳහා පරිශීලකයින්ට පුද්ගලිකව සහාය ලබා දිය යුතු ය.

විසිඑක්වන සියවස වන විට සාම්ප්‍රදායික පුස්තකාලයාධිපතිත්වය ද්‍රව්‍යමය හැසිරවීමේ සිට තොරතුරු හැසිරවීම තෙක් මාරුවීමට පටන් ගත්තේ ය. "තොරතුරු පිපිරීම" (Information Explosion) ලෙස හඳුන්වන අවධිය උදාවීමත් සමග ම මෙම තත්ත්වය විශාල වශයෙන් වර්ධනය විය. ඒ සමග ම පුස්තකාලයාධිපතිත්වයේ ඇති වැදගත්කම සමාජයේ මිනිසුන් අතර අවබෝධ විය (රණසිංහ, 1993). පොත් එකතු කිරීමේ වර්ධනය සහ පුස්තකාල සම්පත් භාවිතය කෙරෙහි නව අවධානයක් යොමු කිරීම නිසා පුස්තකාලයාධිපතිවරයාගේ වගකීම් විශාල ලෙස වෙනස් වූයේ පශ්චාත් යුද සමයේදී ය. සෑම විෂයක ම ප්‍රකාශයට පත් කරන ලද සාහිත්‍ය කෘති ප්‍රමාණාත්මක ලෙස වර්ධනය වූ අතර ද්විතීයික ප්‍රභවයන්ගේ වර්ධනය හා නිෂ්පාදනය ද සැලකිය යුතු ලෙස වැඩි විය. එබැවින් මෙම තොරතුරු සමූහයෙන් නිශ්චිත තොරතුරු සොයා ගැනීම ඉතා අපහසු විය. තොරතුරු සොයන්නන්ගේ අවශ්‍යතා විවිධාකාර බැවින්, පරිශීලකයින්ගේ නිශ්චිත ඉල්ලීම් අනුව තොරතුරු සැකසීම, සංරක්ෂණය කිරීම සහ බෙදා හැරීම ද පුස්තකාලය මඟින් සිදු කෙරේ. මෙම ක්‍රියාවලියේ දී ප්‍රලේඛන සැකසීම, තොරතුරු තෝරා බේරා ගැනීම, තොරතුරු බෙදා හැරීම සහ පරිවර්තනය ආදි විශේෂිත සේවාවන් සපයනු ලැබේ.

**4.4 පුස්තකාලයාධිපතිවරයා මුහුණ දෙන අනාගත අභියෝග**

පුස්තකාලය හා තොරතුරු පරිසර තත්ත්වය වේගයෙන් වෙනස් වෙමින් පවතී. නූතන පුස්තකාලය හුදෙක් දැනුමේ ස්ථිතික ගබඩාවේ සිට සේවා මධ්‍යස්ථාන දක්වා වෙනස් වී ඇත. පුස්තකාල පාඨකයාගේ ද දැනුම සෙවීමේ ක්‍රමවේදය මෙන් ම තොරතුරු සෙවීමේ

මාධ්‍යය ද වෙනස් වී ඇත. මෙසේ බුද්ධිමය හා තාක්ෂණික පරිසරයෙහි වෙනස් වීම් හමුවේ පුස්තකාල වෘත්තිය ද පරිවර්තනය වෙමින් පවතී.

එසේ වුව ද තොරතුරු ප්‍රභවයන් සහ අනුග්‍රාහකයන් අතර යාන්ත්‍රණය සම්බන්ධ කිරීමක් ලෙස වෘත්තිය විසින් සපයනු ලබන සේවාවන් පිටුපස ඇති මූලික දර්ශනය නොවෙනස්ව පවතී. එසේ වුව ද සමාජමය, බුද්ධිමය හා තාක්ෂණික ක්ෂේත්‍රවල දියුණුව මගින් වරින් වර බලපාන වෘත්තීය ක්‍රියාකාරකම් වෙනස් විය. තොරතුරු මූලාශ්‍ර එකතු කිරීම, සංවර්ධනය කිරීම, සංවිධානය කිරීම හා සම්බන්ධ වෘත්තීය ක්‍රියාකාරකම් නව පරිසරයට අනුව, නව නිපුණතා ඉල්ලා සිටින වෙනස්කම් වලට අදාළව සිදුවිය යුතු වෘත්තිය වෙනස්කම්වලට පුස්තකාල වෘත්තිය භාජනය වී ඇත. එපමණක් නො ව පුස්තකාල තොරතුරු භෞතික සන්තකයේ තබා ගැනීම පමණක් තවදුරටත් සේවා සඳහා නිර්ණායකයක් නො වේ. ඇතැම් තොරතුරු අන්තර්ජාලය තුළින් ද ලබා ගත හැකි ය. එබැවින් සන්තකයේ තබා ගැනීම වෙනුවට අන්තර්ජාල ප්‍රවේශය ආදේශ වී ඇත. මෙය එක් අතකින් පුස්තකාලයාධිපතිවරයාට අභියොගයකි. පුස්තකාල මෙහෙයුම් සහ සේවාවන්හි දක්නට ලැබෙන වෙනස්කම් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය විනිවිද යාම ඉතා වේගවත් වී ඇත. කෙසේ වෙතත් පුස්තකාලාධිපතිවරයා සතු ප්‍රධාන කාර්යයන් තොරතුරු මූලාශ්‍ර (ලේඛන) එක් රැස් කිරීම, ලේඛන සංවිධානය කිරීම සඳහා තාක්ෂණික සැකසුම් ගොඩ නැගීම, ලේඛන සඳහා යොමු කිරීම සහ ග්‍රන්ථ නාමාවලිය ලබා දීම, කියවීම සඳහා භෞතික පහසුකම් සැපයීම, පුස්තකාල භාවිත කරන්නන්ගේ දැනුම හැසිරවීම සඳහා අවශ්‍ය විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වශයෙන් හඳුනාගත හැකි ය (ගුණසේකර, 1998).

තොරතුරු තාක්ෂණයේ වර්ධනයත් සමග ම වර්තමාන ලෝකයේ පුස්තකාලයට හා තොරතුරු සේවාවන්ට ඍජුව ම බලපෑම් කළ උපකරණය පරිගණකය යි. පරිගණක සහ අනෙකුත් ඉලෙක්ට්‍රොනික උපකරණ භාවිතය පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථානවල මුහුණුවර වෙනස් කිරීමට හේතු වී ඇත. පරිගණකය තොරතුරු පටිගත කිරීම, විශ්ලේෂණය කිරීම සහ උද්ධරණය කිරීම මෙන් ම ජාලකරණය සඳහා ද යොදා ගනී. CD-ROMs සහ අනෙකුත් බහුමාධ්‍ය ආකෘති (Multimedia Formats) වැනි නව මාධ්‍ය පුස්තකාල සහ තොරතුරු සේවාවන්හි සමස්ත ස්වරූපය වෙනස් කිරීමට හේතු වී ඇත. විදුලි සංදේශ තාක්‍ෂණයේ වර්ධනයත් තොරතුරු ගම්මානයක ආකෘතී තුළට ලෝකය ගෙනැවිත් ඇති අතර මේවා පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථාන මගින් සේවාවන් සැපයීමට ඉමහත් විභවයක් සපයයි. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ වර්ධනය හේතු කොට ගෙන වර්තමානය වන විට ජාතික, කලාපීය හා ජාත්‍යන්තර මට්ටමින් පුස්තකාල හා තොරතුරු ජාල ක්‍රියාත්මක වීම සිදු වේ. පුස්තකාල හා තොරතුරු මධ්‍යස්ථාන ස්වයංක්‍රීයකරණය සහ ජාලකරණය සඳහා වූ මෘදුකාංග සංවර්ධනය කර සපයනු ලැබ ඇත්තේ කාර්යයන්, පරිශීලක සුහදතාව, කාර්යක්ෂමතාව ඇති කිරීම සඳහා ය. විවිධ සංවිධාන විසින් පුස්තකාල ඒකාබද්ධ වැඩසටහන් සඳහා විවෘත මෘදුකාංග සංවර්ධනය කිරීමේ දී බොහෝ කාර්යයන් සිදු කර ඇත. ඒ හා සමානව ඩිජිටල් පුස්තකාල මෘදුකාංග සහ ග්‍රීන්ස්ටෝන්, ඩී-ස්පේස් වැනි විවෘත මෘදුකාංගවල ද ප්‍රගතියක් ලබා තිබේ. මෙම මෘදුකාංග සඳහා විවිධ ක්‍රමලේඛ භාවිත කළ හැකි ය. තොරතුරු තාක්ෂණ දියුණුවේ සන්දර්භය තුළ, මානව සමාජයේ සියලු සංවර්ධනයන් සඳහා අත්‍යවශ්‍ය තොරතුරු සැපයීම හා බෙදා හැරීම සම්බන්ධයෙන් පුස්තකාල හා තොරතුරු

වෘත්තිකයින්ට අභියෝග රැසකට මුහුණ දීමට සිදු වී තිබේ. වර්තමානයේ ලොව පුරා පුස්තකාල සියල්ලක් ම වෙනස්කම්වලට භාජනය වෙමින් පවතී. එය නව සංසිද්ධියක් ද නො වේ. ඒ අනුව වත්මන් පුස්තකාලයාධිපති සහ තොරතුරු වෘත්තිකයා ඔහුගේ සාම්ප්‍රදායික භාවිතයන්ට අමතරව තොරතුරු විශ්ලේෂක, පරිවර්තක, පහසුකම් සපයන්නා සහ උපදේශක යනා දී විවිධ භූමිකාවල නිරත වී ක්‍රියා කිරීම අත්‍යවශ්‍ය වේ. ස්වයංක්‍රීය පුස්තකාල, විද්‍යුත් පුස්තකාල, ඩිජිටල් පුස්තකාල, අථත්‍ය පුස්තකාල වැනි සංකල්ප මෙම දිශාවට යොමු වේ. මෙම නව පරිසරය තුළ වේගයෙන් වර්ධනය වන තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය සමඟ පුස්තකාලයාධිපතිගේ නිපුණතා වර්ධනය කර ගැනීම ද අත්‍යවශ්‍ය වේ. නව සමාජ අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්වීම සඳහා වෘත්තිකයින්ට මෙම නිපුණතා ප්‍රගුණ කළ යුතු අතර ඒවා අසාර්ථක වුවහොත් ඔවුන් කොන් කරනු ලැබීමට හෝ වඳ වීමේ තර්ජනයකට ලක්වීම වළක්වාගත නො හැකි ය. මේ අනුව එය පැවැත්ම පිළිබඳ සංසිද්ධියකි. වෘත්තිකයින් එය තේරුම් ගත් විගස ම පුස්තකාල වෘත්තිය වඩාත් යහපත් වෘත්තියක් වනු ඇත.

## 5. සමාලෝචනය

පුස්තකාල හා තොරතුරු විද්‍යා වෘත්තියේ වෘත්තීයභාවය පරීක්ෂා කිරීමටත්, එම වෘත්තියේ කාර්ය භාරය හා අනාගත අභියෝග විමර්ශනයට ලක්කිරීමටත් මෙම ලිපිය මගින් උත්සාහ දරන ලදි. එය සිදු කිරීමේ දී මාතෘකාවට ප්‍රමාණවත් ආවරණයක් සැපයීම සඳහා අධ්‍යයනයේ නිශ්චිත අරමුණ වූ වෘත්තියක් ලෙස පුස්තකාලයාධිපතිත්වයේ වටිනාකම කෙබඳු ද යන්න සොයා බලන ලදී. තව ද වෘත්තිකයින් ලෙස පුස්තකාලයාධිපතිවරුන් මුහුණ දෙන අභියෝග සහ එම අභියෝග ජය ගැනීම සඳහා වූ උපාය මාර්ග පිළිබඳව ද අවධානය යොමු කර ඇත. වෘත්තියක් යනු සමාජයේ යහපත සඳහා විශේෂිත විෂයක විශේෂිත දැනුමක් සහිත වීම යි. වෘත්තීය ක්‍රියාකාරකම් යනු ක්‍රමානුකූල දැනුම හා ප්‍රවීණතාව මත සමාජීය අවශ්‍යතා වෙනුවෙන් කටයුතු කිරීම වේ. වෛද්‍ය විද්‍යාව, නීතිය වැනි වෙනත් ස්ථාපිත වෘත්තීන් හා සසඳන විට පුස්තකාලයාධිපතිත්වය පැරණි වෘත්තියක් නො වේ. රැකියාව සහ රැකියාව යන අර්ථය ඇති වෘත්තිය අතර සියුම් වෙනසක් ඇත. රැකියාව පුහුණුව සම්බන්ධයෙන් ලබා ගත හැකි වුවත් රැකියාවක් ඉටු කිරීමේ දී යම් ආකාරයක නිපුණතාවක් ඉල්ලා සිටින විට එය වෘත්තියක් බවට පත්වේ. වෘත්තිය යනු විශේෂිත අධ්‍යයන ක්ෂේත්‍රයක් හැසිරවීමට, විශේෂිත දැනුම හා කුසලතා අවශ්‍ය වන, වෘත්තිය අභිමත අරමුණු පෙරටු කොට ගෙන කිසියම් ප්‍රමිතියකට අනුව සිදුකරනු ලබන ක්‍රියා පටිපාටියකි. මේ අනුව පුස්තකාලයාධිපති වෘත්තිය ද අනාගතය ඉතා සංකීර්ණ හා අවිනිශ්චිතතාවන්ගෙන් පිරුණු වෘත්තියක් බව පැහැදිලි ය. පුස්තකාලයාධිපති වෘත්තියට කේන්ද්‍රීය අභියෝගය වන්නේ අනාගතයේ බිහි වන විවිධ තොරතුරු තාක්ෂණයන් සහ ඒවාට අනුගත වීමට හැකි ආකාරයේ වෘතිකයින් පුහුණු කර ගැනීම යි. එම අනුගත වීම දැනුම සහ කුසලතා මත පමණක් නොව ආකල්පමය වශයෙන් ද සිදු විය යුතු වෙනස් වීමකි. එසේ වුවහොත් පුස්තකාලයාධිපතිත්වයේ අනාගතය සමෘද්ධිමත් වීම කිසිවෙකුටත් අවහිර කළ නොහැකි වනු ඇත.

## පරිශීලන නාමාවලිය


ආනන්ද තිස්ස, ආර්. ඩී. (2019). *පුස්තකාල වෘත්තිය පුස්තකාලයාධිපතිත්වයේ ඉතිහාසය විකාසය හා නව ප්‍රවණතා.* මරදාන: එස්. ගොඩගේ.

ගුණසේකර, ධනපාල. (1998). *පුස්තකාල සේවාවේ මූලිකාංග.* මරදාන: එස් ගොඩගේ.

රණසිංහ. පියදාස. (1993). පුස්තකාලයාධිකාරිත්වය පිළිබඳ අදහස් කිහිපයක්. *පුස්තකාල ප්‍රවෘත්ති,* 1993 අප්‍රේල්.

වීරසිංහ, ඩබ්. කේ. එම්. එම්. කේ. (2001). *පුස්තකාල ඉතිහාසය: පුස්තකාල ආරම්භයේ සිට නූතන යුගය දක්වා සංක්ෂිප්ත විවරණයි.* දළුගම: කර්තෘ ප්‍රකාශන.

වීරසූරිය, ඩබ්. ඒ. (2000). පුස්තකාලයාධිපති වෘත්තිය හා වර්තමාන පුස්තකාලයාධිපතීන්ගේ කාර්ය භාරය, පුස්තකාල ප්‍රවෘත්ති, 2000 ඔක්. නොවැ.

Ahmad, P. & Yaseen, M. (2009). 'The Role of the Library and Information Science Professionals Managers: A Comparative Analysis', *Electromic Journal of Academi and Spcial Librarianship*, 10(3). Available at: http://southernlibrarianship.icaap.org/content/v10n03/ahmad_p01.html.

Dakhole, P. (2004). 'Librarianship as a Profession', in Vashisht, C. and Satija, M. (eds) *Library and Information Profession*. 1st edn. Delhi: B.R.Publishing Corporation.

Evetts, J. (2003) 'The Sociological Analysis of Professionalism: Occupational Change in the Modern World', *International Sociology*. SAGE Publications Ltd, 18(2), pp. 395–415. doi: 10.1177/0268580903018002005.

Lancour, H. (1962). "The librarians' Search for Status", in Philip, E. H. and Winger, H. W. (eds) *Seven Questions about Profession of Librarianship*. Chicago: University of Chicago Press.

Oxford English Dictionary. (2008). online, http://www.lexico.com/en https://www.oxfordreference.com/view/10.1093/acref/...001.../acref-9780195123715 accessed October 6, 2016.

Sills, D. L. (1962). 'International Encyclopedia of the Social Sciences', *International Encyclopedia of the Social Sciences*. University of Chicago Press.